# ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සූක්ෂම පරිමාණ ව්‍යාපාරයන්හි ක්‍රියාකාරිත්වය අතර සම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනයක් (නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්ෂේත්‍ර සමීක්ෂණයක් ඇසුරෙනි)

**සුරේෂ් ද මැල්[1] සහ එස්. ඒ. යූ. නිරංජලා[2]**

*[1]ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.*

*[2]සමාජීය විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ*

**මූල පද:** ස්ත්‍රී පුරුෂ සමාජභාවය**,** සුක්ෂම පරිමාණ ව්‍යාපාරය, විෂමතාව, ආදායම හා වියදම

## හැඳින්වීම

මහා පරිමාණ, මධ්‍ය පරිමාණ, කුඩා පරිමාණ මෙන්ම සුක්ෂම පරිමාණ ව්‍යාපාරයන් ද කාර්මික සංවර්ධනයට වැදගත් දායකත්වයක් සපයයි (දයානන්ද, 1995). මන්ද ආදායම් හා රැකියා ජනනය කිරීමේ හැකියාව, ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලියට කරනු ලබන දායකත්වය, මානව ප්‍රාග්ධන සම්පාදන ක්‍රියාවලියට කරනු ලබන දායකත්වය, ආර්ථික අස්ථායීතා හා අවපාත වලට මුහුණ දීම හා දිළිඳුකම තුරන් කිරීම යන ක්ෂේත්‍ර ඔස්සේ සූක්ෂම පරිමාණ කර්මාන්ත ආර්ථික වර්ධනයට දායකත්වය දරයි. වර්තමාන සමාජය තුල පිරිමියා පමණක් නොව කාන්තාවද ධනෝපායන මාර්ගයන්හි නිරත වෙමින් සිටී (හේරත්, 2000). නමුත් ස්ත්‍රීන් විසින් පවත්වාගෙන යන්නාවූ සූක්ෂම පරිමාණ ව්‍යාපාරයන් පිළිබඳව කර ඇති පර්යේෂණ පිළිබඳ විමර්ශනයේදී ස්ත්‍රීන් පුරුෂයින්ට සාපේක්ෂව අඩුවෙන් ඉපයීම් කරන බව දක්වයි (de Mel et al., 2009; Stevenson and St-Onge, 2005a; Stevenson and St-Onge, 2005b). ස්ත්‍රී පුරුෂ භාවය කර්මාන්තයන්හි ක්‍රියාකාරිත්වයට බලපෑමක් එල්ල කරන්නේ නම් එය සංවර්ධනයට ගැටළුවකි. මන්ද ස්ත්‍රීත්වය හෝ පුරුෂත්වය යන සාධකය රටක සංවර්ධනය උදෙසා ප්‍රබල සාධකයක් නොවන අතර රටක මානව සම්පත සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වන නිසාවෙනි. නමුත් සූක්ෂම පරිමාණ කර්මාන්ත සම්බන්ධයෙන් කර ඇති පර්යේෂණයන්හි මූලික ප්‍රතිඵලයක් වශයෙන් දක්වනුයේ කාන්තාවන් විසින් පවත්වා ගෙන යන්නාවූ ව්‍යාපාරයන් සාපේක්ෂව අඩු ඉපයීම් සිදු කරන බවයි (de Mel et al., 2009; දයානන්ද, 1995). එම සූක්ෂම පරිමාණ කර්මාන්තයන් අසාර්ථක වන්නේ නම් ඒ සඳහා බලපාන සාධක අධ්‍යයනය ඉතා වැදගත් වේ. මන්ද ගැටළු අධ්‍යයනය තුලින් පිළියම් යෙදීමට අවස්ථාවක් සැලසෙනවා සේම ඒ තුලින් ව්‍යාපාරයන් සාර්ථක කර ගැනීමට මෙන්ම ආර්ථික සංවර්ධනයටද හේතු වන බැවිනි.

**අධ්‍යයනයේ අරමුණු**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සුක්ෂම පරිමාණ ව්‍යාපාරයන්හි ලාභයෙහි විෂමතාවයක් පවතීද යන්න අධ්‍යයනය කිරීම වන අතර අනුයාත අරමුණු වශයෙන් සුක්ෂම පරිමාණ කාන්තා ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටළු අධ්‍යයනය කිරීම, සුක්ෂම පරිමාණ ව්‍යාපාරයන්හි ව්‍යවසායකයින්ගේ ක්‍රියාකාරිත්වය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත විෂමවේද යන්න අධ්‍යයනය කිරීම සහ සුක්ෂම පරිමාණ ව්‍යාපාරයන්හි වාර්තාගත ලාභයත් වාර්තාගත ආදායම හා වාර්තාගත වියදම අතර වෙනසත් අතර පවත්නා සහසම්බන්ධතාවය අධ්‍යයනය කිරීම වේ.

**ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතියික දත්ත මත පදනම්ව අධ්‍යයනය කරන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි තුලාන් 10ක් අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරා ගත් අතර ඒ තුල පවත්නා සියළුම ව්‍යාපාර ලැයිස්තු ගත කිරීමෙන් පසුව නියැදිය සඳහා සූක්ෂම පරිමාණ ව්‍යාපාරයන් 201ක් තෝරා ගන්නා ලදී. නියැදිය සඳහා සිල්ලර වෙළදාමේ යෙදෙන සූක්ෂම පරිමාණ ව්‍යාපාරයන් පමණක් තෝරා ගැනීම විශේෂත්වයකි. ප්‍රශ්නාවලීන් ආශ්‍රයෙන් ප්‍රමාණාත්මක දත්ත මෙන්ම ගුණාත්මක දත්තයන්ද රැස්කිරීම සිදුකරන ලද අතර ප්‍රමාණාත්මක දත්තයන් විශ්ලේෂණය කිරීම සඳහා වගු, ප්‍රස්ථාර, t පරීක්ෂාව මෙන්ම බහුවිධ ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රමය උපයෝගී කර ගන්නා ලදී. මෙහිදී ලාභය (Y) පරායත්ත විචල්‍ය වශයෙන්ද, ඉඩම් හා ගොඩනැගිලි හැර ව්‍යාපාරයේ යොදවා ඇති වත්කම් (K), ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම (T) , ශ්‍රමිකයින් සේවයේ යෙදෙන මුළු පැය සංඛ්‍යාව ($L_2$) හා අයිතිකරු සේවයේ යෙදෙන මුළු පැය සංඛ්‍යාව ( $L_1$) ස්වායත්ත විචල්‍යයන් වශයෙන් භාවිතා කරන ලදී. ඒ අනුව ගොඩ නගන ලද ප්‍රතිපායන සමීකරණය පහත පරිදි විය (දෝෂ පදය ඇතුලුව).

$$Y = \beta_0+\beta_1K+\beta_2L_1+\beta_3L_2+\beta_4T+\beta_GG+e_i$$

මෙහි G යනු ස්ත්‍රී පුරුෂ සමාජභාවය දක්වන විචල්‍යයයි (පිරිමි=1, ගැහැණු=0). පරායත්ත විචල්‍යය වන ලාභය ක්‍රම 2කට ගණනය කරන ලදී. එනම්, (i) ව්‍යාපාරයෙන් ඉපයූ ලාභය කොපමණ වේද යන්න ව්‍යවසායකයින්ගෙන් සෘජුවම අසා සටහන් කර ගැනීමෙන් සහ (ii) ව්‍යාපාරයේ ආදායම හා වියදම විමසා ආදායම හා වියදම අතර වෙනස ගණනය කිරීමෙන් ලාභය ලබා ගන්නා ලදී (de Mel et al., 2009).

### පර්යේෂණ ප්‍රතිඵල

ඉහත සමීකරණයට අදාළව ලද පර්යේෂණ ප්‍රතිඵල තොරතුරු පහත වගුවෙන් දැක්වේ.

වගුව 01: ලාභය කෙරෙහි බලපාන්නා වූ සාධක අධ්‍යයනය

| **ස්වායත්ත විචල්‍යයන්** | **ආදායම් වියදම** | **(ආදායම- වියදම) -ලඝු** | **වාර්තාගත ලාභය** | **වාර්තාගත ලාභය -ලඝු** |
|---|---|---|---|---|
| ස්ථාවර පදය | -441.378 (2791.711) | 2.438* (1.464) | 2690.47 (1718.287) | 4.877*** (0.844) |
| ව්‍යාපාරයේ යොදවා ඇති වත්කම් | 0.019*** (0.003) | 0.457*** (0.089) | 0.010*** (0.002) | 0.241*** (0.053) |
| ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම | 0.000 (0.000) | 0.003 (0.028) | 6.029E-5 (0.000) | 0.081 (0.015) |
| ශ්‍රමිකයින් සේවයේ යෙදෙන මුළු පැය සංඛ්‍යාව | -3.157 (0.679) | 0.113** (0.053) | 2.919 (4.671) | 0.033 (0.031) |
| අයිතිකරු සේවයේ යෙදෙන මුළු පැය සංඛ්‍යාව | 64.187 (0.113) | 0.105 (0.342) | 12..262 (25.345) | 0.172 (0.196) |
| **ස්ත්‍රී පුරුෂ සමාජභාවය** | 3604.671** (1424.671) | 0.653*** (0.209) | 2429.58*** (886.925) | 0.284** (0.123) |

මූලාශ්‍රය : සමීක්ෂක විසින් ගණනය කරන ලදී

*** = සියයට 01 මට්ටමේදී වෙසෙසි වේ $t < 0.01$

** = සියයට 05 මට්ටමේදී වෙසෙසි වේ $t < 0.05$

* = සියයට 10 මට්ටමේදී වෙසෙසි වේ $t < 0.1$

ඉහත වගුවට අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ව්‍යාපාරයේ යොදවා ඇති වත්කම් (ඉඩම් සහ ගොඩනැගිලි හැර ව්‍යාපාරයේ පවත්නා අනෙකුත් භෞතික වත්කම්හි වටිනාකම) සූක්ෂම පරිමාණ ව්‍යාපාරයන්හි ලාභය කෙරෙහි වෙසෙසි බලපෑමක් සිදු කරන බව කිව හැකිය. එලෙසම ගැහැණු ව්‍යාපාරවලට සාපේක්ෂව පිරිමි ව්‍යාපාර වැඩි ලාභයක් උපයන බව දක්වයි. තවද, ක්‍රම දෙකකට ගණනය කරන ලද ලාභයෙහි වෙනසක් පවතීද යන්න සහසම්බන්ධතා සංගුණකය ආශ්‍රයෙන් සිදු කරන ලදී. ඒ අනුව, පියර්සන්ගේ සහසම්බන්ධතා සංගුණක අගය 0.653ක් හා ස්පියර්මන්ගේ සහසම්බන්ධතා සංගුණක අගය 0.75ක් වූ අතර මෙම අගයන් දෙකම සියයට එකේ මට්ටමේදී වෙසෙසි විය. ඒ අනුව පෙනී යන්නේ ක්‍රම දෙකකට ලාභය ගණනය කළද එම ක්‍රම දෙකෙහි විශාල විෂමතාවයක් හඳුනා ගත නොහැකි බවය. ආදායම-වියදම සම්බන්ධයෙන් පිරිමි ව්‍යවසායකයින්ගේ මධ්‍යයන අගය රුපියල් 11100 ක් හා කාන්තාවන්

සම්බන්ධයෙන් මධ්‍යයන අගය රුපියල් 8024.39ක් වූ අතර වාර්තාගත ලාභය සම්බන්ධයෙන් පිරිමි පාර්ශවයෙහි මධ්‍යයන අගය රුපියල් 8029.13ක් හා කාන්තාවන් සම්බන්ධයෙන් මධ්‍යයන අගය රුපියල් 6150.68ක් විය. එම අගයන්ද t පරීක්ෂාවට අනුව සියයට දහයේ මට්ටමේදී වෙසෙසි වීමෙන් ලාභය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස් වන බව ප්‍රකාශ කළ හැකිය.

## නිගමනය

සූක්ෂම පරිමාණ ව්‍යවසායකයින් සම්බන්ධයෙන් අධ්‍යයනයේදී අනාවරණය වූයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත එකී ව්‍යාපාරයන්හි ලාභයෙහි විෂමතාවයක් පවත්නා බවයි. එනම් පුරුෂ පාර්ශවය ව්‍යවසායකත්වය දරන්නා වූ සූක්ෂම පරිමාණ ව්‍යාපාරයන්හි ලාභය කාන්තාවන් ව්‍යවසායකත්වය දරන්නා වූ සූක්ෂම පරිමාණ ව්‍යාපාරයන්ට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බවයි. කාන්තා ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටළු වශයෙන් ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් වැය කළ හැකි කාලය අඩුවීම, පිරිමි සේවකයින් සමග කටයුතු කිරීමේ අපහසුතාවය, ප්‍රාග්ධන හිඟය, පුහුණු වැඩසටහන් වලට සහභාගිවීමේ පවත්නා දුෂ්කරතාවයන් යනාදිය දැක්විය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


හේරත්, සුභාංගි. (2000). කාන්තාව, වැඩ, රැකියාව හා සේවයඃ විනිවිද, ස්ත්‍රී සේවා නියුක්තියේ හරස්කඩක්. කොළඹඃ කාන්තා අධ්‍යයන හා පර්යේෂණ කේන්ද්‍රය.

දයානන්ද, ඇල්ෆ්‍රඩ්. (1995) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත. කොළඹඃ ගුණසේන ප්‍රකාශකයෝ.

de Mel, Suresh, David Mckenzie and Christopher Woodruff. (2009). "Are Women more Credit Constrained? Experimental Evidence on Gender and Microenterprise Returns." American Economic Journal: Applied Economics, Vol.1, No. 3, p:1-32.

Gunatilaka, Ramani and Dulan de Silva. (2010). Microfinance and Women's Empowerment: The Impact of Loan Ownership on Women's Empowerment in Microfinance Households in Sri Lanka. Colombo: Centre for Women's Research (CENWOR).

Stevenson, L. and St-Onge, A. (2005a). Support for Growth–oriented Women Entrepreneurs in Kenya. Geneva: International Labour Organization.

Stevenson, L. and St-Onge, A. (2005b). Support for Growth–oriented Women Entrepreneurs in Ethiopia. Geneva: International Labour Organization.